# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 302 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 20/02/2024 පැය 0655

**මාධ්‍ය නිවේදනය**

**වෙඩි තබා තුවාල සිදු කිරීමක් - බොරැල්ල පොලිස් වසම.**

2024.02.19 වන දින රාත්‍රී කාලයේ බොරැල්ල පොලිස් වසමේ ආනන්ද රාජකරුණා මාවත ප්‍රදේශයේ මහල් නිවාසය තුලදී සිදුකළ වෙඩි තැබීමකින් පුද්ගලයෙකු තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ඇති බවට බොරැල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 38 ක් වූ නාගලගම්වීදිය, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරු මීට දින කිහිපයකට පමණ ඉහතදී මෙම මහල් නිවාසයේ තාවකාලික පදිංචියට පැමිණ ඇති අතර යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයෙකු විසින් රිවොල්වරයක් වැනි අවියකින් මෙම වෙඩි තැබීම සිදුකර පලාගොස් ඇති බවට අනාවරණය වන අතර වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත.

තවද මෙම තුවාලකරු ප්‍රධාන පෙලේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු හා සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු ලෙස ලේබන ගතවී ඇති අතර වෙරළබඩ පොලිස් ස්ථානය මගින් මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන බන්ධනාගාර ගතව සිට 2024.02.05 වන දින ඇප ලබා පැමිණි පුද්ගලයෙකු බවට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

තුවාලකරු දැනට කොළඹ ජාතික රෝහලේ දැඩිසත්කාර ඒකකයේ නේවාසිකව ප්‍රතිකාර ලබයි. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**